# ලෝක මහා සංග්‍රාම සහ ලෝක සාමය සඳහා ප්‍රයත්න

# 4

20 වන සියවසේ මුල් භාගය තුළ ජීවිත හා දේපළ හානි රැසක් සිදු කෙරෙමින් සමස්ත ලෝකය ම මහා සංග්‍රාම දෙකකට අවතීර්ණ විය. මින් සිදු වූ විනාශය නිසා ම නැවත ලෝක සංග්‍රාමයක් සිදු නොවීමටත් ලෝක සාමය ආරක්ෂා කිරීමටත් ප්‍රයත්න දරන ලදී. යුද්ධයේ ඇති බිහිසුණු බව හා සාමය ආරක්ෂා කිරීමේ වැදගත්කම අතීත සිදුවීම් ඇසුරින් පැහැදිලි කිරීම මෙම පරිච්ඡේදය අධ්‍යයනය කිරීමේ අපේක්ෂාව යි.

## පළමුවන ලෝක මහා සංග්‍රාමය

20 වන සියවස මුල් භාගයේ ඉතා විනාශකාරී ලෝක සංග්‍රාම දෙකක් සිදු විය. ඉන් පළමුවැන්න ක්‍රි.ව. 1914 ජුලි මස 28 වන දින සිට ක්‍රි.ව. 1918 නොවැම්බර් 11 වන දින දක්වා වසර හතරකට වැඩි කාලයක් පැවතිණි. යුද්ධයට ආසන්න ම හේතුන් යුරෝපයෙන් පැන නැගුණ නමුදු,පසු ව යුරෝපා ජාතීන් ගොඩ නගාගෙන තිබූ යටත් විජිතවලට ද එය පැතිර ගියේ ය. අනතුරු ව ඇමරිකා එක්සත් ජනපදය ද මෙම යුද්ධයට සහභාගි විය. එමඟින් අවසානයේ සියලු මහද්වීපවලට පැතිර ගිය මෙම යුද්ධය, ලෝක මහා සංග්‍රාමයක් බවට පත් විය. 20 වන සියවසට පෙර යුරෝපා රටවල් අතර සම්බන්ධතාවලට අදාළ යුද්ධ යුරෝපා රටවලට පමණක් සීමා වූ නමුත්, 20 වන සියවස ආරම්භයේ දී සිදු වූ මෙම යුද්ධය මුළු ලෝකය පුරා ම ව්‍යාප්ත විය. ඒ නිසා එය පළමුවන ලෝක මහා සංග්‍රාමය ලෙස හැඳින්වේ.

## පළමුවන ලෝක මහා සංග්‍රාමයට තුඩුදුන් හේතු

පළමුවන ලෝක සංග්‍රාමය 20 වන සියවසේ මුල් කාලයේ සිදු වුවත් ඊට මුල් වූ කරුණු 19 වන සියවසේ අගභාගයේ සිට ගොනු විය. පළමු ලෝක සංග්‍රාමයට තුඩුදුන් හේතු කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- ඇල්සාස් - ලොරේන් ප්‍රශ්නය
- බිස්මාක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය
- යටත් විජිත සඳහා වූ තරගය
- නැගෙනහිර යුරෝපයේ පැවති තත්ත්වය
- ජර්මනියේ අධිරාජ්‍යවාදි ප්‍රතිපත්තිය
- යුරෝපය පිල් දෙකකට බෙදීම
- සර්යේවෝ සිද්ධිය

## ඇල්සාස් - ලොරේන් ප්‍රශ්නය

ඉතිහාසය පුරා ම ඉතා කුඩා රාජ්‍ය ගණනාවකට බෙදී පැවති ප්‍රදේශ එක්සත් කොට ක්‍රි.ව. 1871 දී ජර්මනිය නමැති නව රාජ්‍යය ගොඩනඟනු ලැබී ය. ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී ප්‍රංශය හා ජර්මනිය අතර හට ගත් යුද්ධයෙන් ජර්මනියට ජය අත් විය. ඒ නිසා එතෙක් ප්‍රංශය සතු ව පැවති යකඩ සහ ගල් අඟුරු නිධානයක් බඳු වූ ඇල්සාස් සහ ලොරේන් ප්‍රදේශ ජර්මනියට ඈඳා ගනු ලැබී ය. එය ප්‍රංශයට සිදු වූ විශාල පාඩුවකි. එම නිසා ප්‍රංශය තුළ ජර්මනිය සමඟ අමනාපයක් ගොඩනැඟිණි. ඒ අනුව ජර්මනියෙන් පළිගැනීම සහ ඇල්සාස් - ලොරේන් ආපසු ලබා ගැනීම ප්‍රංශයේ අරමුණ විය.

ජර්මනිය ක්‍රියා කෙළේ එම ප්‍රදේශ කෙසේ හෝ ජර්මනිය සතු ව තබා ගැනීමට ය. ඇල්සාස් - ලොරේන් ප්‍රශ්නය හේතු කොට ගෙන ප්‍රංශය හා ජර්මනිය තුළ ගොඩනැඟුණු එම පරස්පර විරෝධී අරමුණු ක්‍රි.ව. 1871න් පසුව ප්‍රංශය හා ජර්මනිය මුල් කොට ගෙන යුරෝපය දෙපිලකට බෙදීගිය රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ආරම්භ වීමට හේතු විය.

## බිස්මාක්ගේ ගිවිසුම් ප්‍රතිපත්තිය

ජර්මනිය එක්සත් කිරීමේ මූලිකයා වූ ද දක්ෂ රාජ්‍ය තාන්ත්‍රිකයකු වූ ද ඔටෝ වොන් බිස්මාර්ක්, අලුත ගොඩ නැඟු එක්සත් ජර්මන් රාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා, උපායශිලී ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. ජර්මනියට එරෙහි ව නැගී සිටීමට ඉඩ ලැබෙන පරිදි ප්‍රංශයට මිතුරන් ඇති කොට ගැනීමට ඉඩ නො දී, ප්‍රංශය යුරෝපයේ තනි කිරීම ඔහුගේ උපක්‍රමය විය.



රූපය 4.1
ඔටෝ වෝන් බිස්මාර්ක් මහතා

ඒ අතර යුරෝපයේ මිතුරන් කිහිප දෙනකු සමඟ සම්බන්ධතා ඇති කොට ගනිමින් ජර්මනිය ශක්තිමත් කිරීමට ද ඔහු පියවර ගත්තේ ය. එමඟින් යුරෝපයේ රටවල් අතර ඇති කොට ගත් රාජ්‍යෝපාය සම්බන්ධතා වල කේන්ද්‍රස්ථානය බවට ජර්මනිය පත් කර ගැනීමට ද ඔහු සමත් විය.

සිය උපක්‍රමය සාර්ථක කර ගැනීම අරමුණු කොට ගෙන ජාත්‍යන්තර කටයුතු මෙහෙය වීම ආරම්භ කළ බිස්මාර්ක් ඒ සඳහා ගිවිසුම් ක්‍රමයක් ආරම්භ කෙළේ ය.

එහි පළමු පියවර වශයෙන් ඔහු ක්‍රි.ව. 1873 දී රුසියාව සහ ඔස්ට්‍රියාව සමග එකතු වී "අධිරාජ්‍යවරු තිදෙනාගේ'' සංගමය පිහිටුවා ගත්තේ ය. ටික කලකින් රුසියාව එම හවුලෙන් ඉවත් වූ නමුත් දිගට ම රුසියාව සමඟ සමීප සබඳතා පවත්වා ගැනීමට බිස්මාර්ක් වග බලා ගත්තේ ය. අනතුරු ව ඔස්ට්‍රියාව හා ජර්මනිය අතර ක්‍රි.ව. 1879 දී යුද ගිවිසුමක් ඇති කොට ගත් බිස්මාර්ක් පසු ව එයට ඉතාලිය ද ඈඳාගෙන ක්‍රි.ව. 1882 දී "මධ්‍යම යුරෝපා බලවතුන්ගේ මිත්‍ර හවුල" ගොඩ නැඟී ය.

ඒ වන විටත් මහා බ්‍රිතාන්‍යය යුරෝපා කටයුතුවලට ඍජු ව මැදිහත් වීමෙන් වැළකී එක්තරා ප්‍රමාණයකට "හුදකලාව සිටීමේ" ප්‍රතිපත්තියක් අනුගමනය කෙළේ ය. බැලූ බැල්මට බිස්මාර්ක්ගේ උපාය සාර්ථක වී ඇති බවක් පෙනෙන්නට තිබිණි. ප්‍රංශයට මිතුරන් ලබා ගැනීමේ මං අහුරා තිබිණි.

යුරෝපය පිල් දෙකකට බෙදීමට හේතු වූ මෙම ගිවිසුම් ක්‍රමය, දක්ෂ ලෙස ක්‍රියාත්මක කිරීමට ද බිස්මාර්ක් සමත් විය එහෙත් ක්‍රි.ව. 1890 දී ඔහු බලයෙන් පහවීමෙන් පසු ව ජර්මනියේ පාලකයන්ට බිස්මාර්ක් කළ ආකාරයට උපායශීලී ව මෙම ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක කළ නොහැකි විය. එහි ප්‍රතිඵලය වූයේ ප්‍රංශයට ද මිතුරන් එකතු කොට ගෙන ප්‍රබල පිලක් ගොඩ නඟා ගැනීමට මඟ පෑදීම යි. එමඟින් 20 වන සියවස මුල් දශකය වන විට ලෝක යුද්ධයකට තුඩුදෙන ආකාරයට යුරෝපය පිල් දෙකකට බෙදී යාමට බිස්මාර්ක්ගේ ගිවිසුම් ක්‍රමය හේතු විය.

## යටත් විජිත සඳහා වූ තරගය

19 වන සියවසේ මැද භාගය වන විට යුරෝපයේ සියලු ම රටවල් පාහේ කාර්මීකරණය වීම හේතු කොට නිමි ද්‍රව්‍ය අලෙවි කිරීම හා අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වෙළෙඳපොළ අවශ්‍ය විය. ඒ හේතු කොට ගෙන යුරෝපා රටවල් අතර යටත් විජිත පිහිටුවා ගැනීම සඳහා තරගය වර්ධනය විය. ආසියානු හා අප්‍රිකානු ප්‍රදේශවල මෙසේ යටත් විජිත පිහිටුවා ගත් අතර වැඩි ම යටත් විජිත සංඛ්‍යාවක හිමිකරුවා වූයේ බ්‍රිතාන්‍යය යි. ප්‍රංශය, පෘතුගාලය, ස්පාඤ්ඤය හා ඕලන්දය යන රටවල් ද යටත්විජිත හිමිකරුවෝ වූහ. එක්සත් ජර්මන් රාජ්‍යයක් බිහි වීමෙන්

පසු ව ඇල්සාස් හා ලොරේන් ප්‍රදේශවලින් ලබා ගත් ඛනිජ සම්පත් ද උපයෝගී කොට ගනිමින් ජර්මනිය ශීඝ්‍ර කාර්මික දියුණුවක් උදා කර ගෙන තිබිණි. මේ නිසා නිමි ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා වෙළෙඳපොළ සොයා ගැනීම ජර්මනියට ද අවශ්‍ය විය. ආසියා අප්‍රිකා රටවල් වෙත ජර්මනියේ සම්ප්‍රාප්තිය එතෙක් බලවත්‍ වශයෙන් සිටි බ්‍රිතාන්‍යයට තර්ජනයක් විය. ස්පාඤ්ඤය යටතේ මොරොක්කෝවේ බලය පිහිටුවා ගැනීමට ප්‍රංශයට මෙන් ම ජර්මනියට ද අවශ්‍ය වීම නිසා ප්‍රංශය සහ ජර්මනිය අතර ගැටුමක් ඇති වීමට ආසන්න තත්ත්වයක් ඇති වූ නමුත් පසු ව එය මග හැරිණි. රුසියාව හා ජපානය අතර චීනයේ වෙළෙඳ අයිතිය ලබා ගැනීම සඳහා වූ මතභේදය, උතුරු අප්‍රිකාවේ පිහිටි යටත් විජිත සම්බන්ධයෙන් ප්‍රංශය හා ජර්මනිය අතර වූ මතභේද යනාදි ය මේ අවධියේ යුරෝපා රාජ්‍යය අතර අවිශ්වාසයක් ගොඩනැගීමට සමත් විය. ඒ අනුව යටත් විජිත සඳහා වූ තරගය ප්‍රතිවිරුද්ධ බලකඳවුරුවල බලවතුන්ගේ විරුද්ධවාදී හැඟීම් පෝෂණය කිරීමට බෙහෙවින් දයක විය.

## නැගෙනහිර යුරෝපයේ පැවති තත්ත්වය

බල්ගේරියාව, සර්බියාව, රුමේනියාව වැනි බෝල්කන් ප්‍රදේශවල එක් එක් රාජ්‍ය තුළ විවිධ ජාතිකයෝ කිහිපයක් වාසය කළහ. ඔවුන් එකිනෙකා විරෝධතා හා ආරවුල් ඇති කොට ගැනීම නිසා එම රටවල් අභ්‍යන්තරයේ නිරතුරු ව ව්‍යාකූලත්වයක් පැවතිණි. ඒ නිසා බෝල්කන් ප්‍රදේශයට ව්‍යාප්ත වීමට මාන බලමින් සිටි රුසියාවේ ක්‍රියාමාර්ග කෙරෙහි ඔස්ට්‍රියාව, ප්‍රංශය, ජර්මනිය වැනි සෙසු රටවල් විමසිලිමත් ව සිටියහ.

ඔස්ට්‍රියානු අධිරාජ්‍යයට මෙන් ම තුර්කි අධිරාජ්‍යයට යටත් ව සිටි ස්ලාව්, සර්බියන්, ග්‍රීක, බල්ගේරියන් වැනි විවිධ ජාතීන්ට නිදහස් ජාතීන් වශයෙන් නැගී සිටීමට ඉඩ නොදීම නිසා,එම ප්‍රදේශවල පැවතියේ ඕනෑ ම අවස්ථාවක යුද්ධයකට මඟ පාදා ගැනීමට සුදුසු වාතාවරණයකි. පළමුවන ලෝක යුද්ධයට තුඩුදුන් ආසන්න ම හේතුව වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමාරයා සරයේවෝහි දී මරා දැමීම ද සිදු වූයේ,මෙම වියවුල්කාරී දේශපාලන තත්ත්වයක් පැවති නැගෙනහිර යුරෝපා ප්‍රදේශයේ දී ය. ඒ අනුව පළමුවන ලෝක මහා යුද්ධයට තුඩුදුන් හේතු වර්ධනය වීමේ දී නැගෙනහිර යුරෝපා රටවල වූ ව්‍යාකූල දේශපාලන තත්ත්වය යුරෝපය පිල් දෙකකට බෙදී යාමට බෙහෙවින් බලපා ඇත.

## ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය

ජර්මනියේ අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය කිහිප ආකාරයකින් ම පළමුවන ලෝක යුද්ධයට බලපා ඇත. ජර්මනිය ශක්තිමත් රාජ්‍යයක් ලෙස ගොඩ නැඟීමේ දී සමකාලීන තත්ත්වයන් යටතේ විශාල ලෙස යටත් විජිත අත්පත් කොට ගැනීම ද ඒ සඳහා අවශ්‍ය ශක්තිමත් නාවුක හමුදාවක් ගොඩ නඟා ගැනීම ද, කළ යුතු ව ඇති බව බිස්මාර්ක් දැන

සිටියේ ය. එහෙත්, එබඳු ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම, එකල විශාලතම අධිරාජ්‍යය මෙන් ම ශක්තිමත් නාවුක හමුදාව අයිති ව තිබූ බ්‍රිතාන්‍යයට අභියෝගයක් වන බව ද බිස්මාර්ක් අවබෝධ කොට ගෙන තිබිණි. ජර්මනිය එබඳු ප්‍රතිපත්තියක් අනුගමනය කළහොත්, ප්‍රංශය,යුරෝපයේ තනි කිරීමේ ජර්මන් ප්‍රතිපත්තියට බාධා එල්ලවීමට ඉඩ තිබෙන බව ද, බිස්මාර්ක් දැන සිටියේ ය. එබැවින් ඔහු ඉතා උපක්‍රමශීලී ව ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක කළ අතර මහා බ්‍රිතාන්‍යයට අභියෝග එල්ල වන කිසිවක් නොකිරීමට පමණක් නොව, බ්‍රිතාන්‍යය සමඟ හැකි තරම් දුරට මිත්‍රශීලී ව සිටීමට ද වග බලා ගත්තේ ය.

එසේ වුව ද ක්‍රි.ව. 1888 දී ජර්මනියේ කෛසර් (අධිරාජයා) තනතුරට පත් වූ දෙවන විලියම්ට බිස්මාර්ක්ගේ දක්ෂ රාජ්‍යෝපාය ප්‍රතිපත්තිය අවබෝධ කොට ගත නොහැකි විය. ඔහුට වුවමනා වූයේ හැකි ඉක්මනින් ජර්මනිය විශාල අධිරාජ්‍යයක් බවට පත් කොට ගැනීම යි. ඒ සඳහා ඔහු මුලින් ම බිස්මාර්ක් බලයෙන් පහකොට,අනතුරු ව සියලු රාජ්‍ය පාලන කටයුතු මෙහෙය වීම තමා විසින් ම සිදු කිරීම ආරම්භ කෙළේ ය. එමඟින් සෙසු බලවතුන්ගේ සැක බිය ගොඩ නැඟෙන ආකාරයටත්,මහා බ්‍රිතාන්‍යයට අභියෝග එල්ල වන ආකාරයටත්, ජාත්‍යන්තර සිද්ධි කිහිපයකට මැදිහත් වූ කෛසර්, ජර්මනියේ නාවුක බලය ශක්තිමත් කිරීමට පියවර ගත්තේ ය.

විලියම් කෛසර් මොරොක්කෝව සම්බන්ධයෙන් ප්‍රංශය හා ස්පාඤ්ඤය අතර වූ තරගයේ දී, ප්‍රංශයට අවාසි වන ලෙස ස්පාඤ්ඤයට උදව් උපකාර කෙළේ ය.

- සුළු ආසියාව හා මොරොක්කෝව හරහා පර්සියානු බොක්ක දක්වා, බර්ලින් බැග්ඩෑඩ් දුම්රිය මාර්ගය ඉදිකිරීමට ජර්මනිය තුර්කියට ආධාර දුන්නේ ය. එමඟින් ජර්මනියේ බලය ආසියාවේ පැතිර වීමට මඟ පාදා ගැනීම ජර්මනියේ බලාපොරොත්තුව විය. බර්ලිනයේ සිට බැග්ඩෑඩ් දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීම ආසියාවේ බ්‍රිතාන්‍ය බලයට තර්ජනයක් වීමට ඉඩ තිබූ බැවින්, එය බ්‍රිතාන්‍යයට එල්ල කළ අභියෝගයක් ලෙස දිස් විය.
- ජර්මනිය සිය නාවුක ශක්තිය වැඩි දියුණු කිරීමට ගෙන ගිය වැඩපිළිවෙළ ද බ්‍රිතාන්‍යයට තර්ජනයක් විය. ඊට ප්‍රතිචාර වශයෙන්, බ්‍රිතාන්‍යය ද, එරට යල් පැනගිය නාවික යාත්‍රා නවීකරණය කිරීම ආරම්භ කෙළේ ය. ඒ අනුව බ්‍රිතාන්‍ය නාවික හමුදාව, නවීන තාක්ෂණයෙන් යුක්ත වූ ප්‍රහාරක නැව්වලින් සමන්විත විය. මෙම වර්ගයේ නැව් විශාල වශයෙන් තැනීමට, බ්‍රිතාන්‍යය මෙන් ම ජර්මනිය ද උනන්දු විය.
- එපරිද්දෙන් දෙරට ම නාවික ශක්තිය ප්‍රදර්ශනය කිරීමේ තත්ත්වය, යුද්ධයකට සූදානම් වීමක් බඳු විය. එතෙක් කල් යුරෝපයේ හුදකලාව සිටීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බ්‍රිතාන්‍යය ද, කිසියම් මිතුරකු දිනා ගැනීම කෙරෙහි යොමු විය. එහි දී නිරායාසයෙන් ම බ්‍රිතාන්‍යයට එකතු විය හැකි වූයේ, ජර්මනියේ සතුරා වූ ප්‍රංශය සමඟ යි.
- ඒ අනුව බ්‍රිතාන්‍යය, ප්‍රංශය සමඟ එකතු වී නාවුක ආරක්ෂක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙළේ ය. මහා බ්‍රිතාන්‍යය උතුරු මුහුද ආරක්ෂා කිරීමට භාර ගත්තේ ය.


## යුරෝපය පිල් දෙකකට බෙදීම

බිස්මාර්ක් ප්‍රංශය තනි කිරීම සඳහා අනුගමනය කළ උපායශීලී ප්‍රතිපත්තිය ඔහුගෙන් පසු බලයට පත් වූ ජර්මන් පාලකයන්ට සාර්ථක කොට ගත නොහැකි විය. එම පාලකයන්ගේ ක්‍රියාකලාපය නිසා එතෙක් මධ්‍යස්ථ ව සිටි බ්‍රිතාන්‍යය පවා තම ආරක්ෂාවට ජර්මනිය අභියෝගයක් වන බව අවබෝධ කොට ගෙන මිතුරන් ලබා ගැනීමට පෙළඹිණි. ඒ අනුව බිස්මාර්ක් ක්‍රියාත්මක කළ උපාය පරාජය කරමින් ප්‍රංශයට බ්‍රිතාන්‍යය සමඟ මිත්‍ර වීමට අවස්ථාව උදා විය.ප්‍රංශය හා බ්‍රිතාන්‍යය අතර මිත්‍ර ගිවිසුම 1904 දී අත්සන් තබනු ලැබී ය. අනතුරු ව 1907 දී එයට රුසියාව ද එක්වීමෙන්, ත්‍රෛපාක්ෂික මිත්‍ර සන්ධානය බිහි විය. ඒ අනුව 20 වන සියවස මුල් දශකය තුළ යුරෝපයේ ප්‍රබල කඳවුරු දෙකකට බෙදී සිටීම, පළමු වන ලෝක යුද්ධයට බලපෑ ප්‍රධානතම හේතුවක් විය. මහා බලවතුන් එසේ පිල් දෙකකට බෙදුණු අතර, සෙසු රටවල් ඔවුනොවුන්ගේ අවශ්‍යතා අනුව එම පිල් දෙකෙන් එකකට එකතු විය. ඒ අනුව "**මිත්‍ර බලවතුන්** " හා "**මධ්‍යම බලවතුන්** " ලෙස පිල් දෙක නම් කෙරිණි.


## සරයේවෝ සිද්ධිය

පළමුවන ලෝක යුද්ධයේ ආසන්න ම හේතුව වූයේ සරයේවෝ සිද්ධිය යි. එනම්, සර්බියාවේ සංචාරයක යෙදී සිටි ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමාරයා වූ ආච් ඩියුක් ප්‍රාන්ස් පර්ඩිනන්ඩ් හා ඔහුගේ බිරිඳ ක්‍රි.ව. 1914 ජුනි 28 දින සර්බියාවේ සරයේවෝ නුවර දී සර්බියානුවන් විසින් මරා දැමීම යි. දේශසීමා ප්‍රශ්න මත එවකට සර්බියාව සමඟ අමනාපයෙන් පසු වූ ඔස්ට්‍රියාව,මෙම සිද්ධිය තමන්ට විරුද්ධ ව කරන ලද කුමන්ත්‍රණයක් ලෙස සලකා කොන්දේසි කිහිපයක් ඉදිරිපත් කොට,සර්බියාවෙන් අලාභ ඉල්ලා සිටියේ ය. එහෙත් සර්බියාව එය ප්‍රතික්ෂේප කිරීම නිසා ක්‍රි.ව. 1914 ජුලි 28 දින ඔස්ට්‍රියාව එම රටට විරුද්ධ ව යුද්ධය ප්‍රකාශ කෙළේ ය.

ඔස්ට්‍රියාවේ ප්‍රබල මිත්‍ර රට වශයෙන් සිටි ජර්මනිය ද මෙම යුද්ධ ප්‍රකාශ කිරීම අනුමත කළ අතර, සර්බියාව රුසියාවෙන් ආධාර පැතී ය. මීට සම්බන්ධ නොවන ලෙස ජර්මනිය, රුසියාවෙන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප විය. ඒ නිසා අගෝස්තු 01 වන දින ජර්මනිය රුසියාවට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කෙළේ ය. ඒ වන විට ප්‍රංශය හා රුසියාව අතර මිත්‍ර ගිවිසුමක් පැවති බැවින් ප්‍රංශයට විරුද්ධ ව ද ජර්මනිය විසින් යුද්ධ ප්‍රකාශ කරන ලදී. මෙසේ 19 වැනි සියවසේ අගභාගයේ සිට අවුරුදු 40 කට ආසන්න කාලයක් යුරෝපා ජාතීන් එකිනෙකා කෙරෙහි ඇති කොට ගත් සැකයත් වෛරයත් මත තැන තැන ඇති වූ ගැටුම් ක්‍රමයෙන් උත්සන්න වී දින 50 ක් පමණ ඇතුළත එය විශාල යුද්ධයක් බවට පත් විය.




සිතියම 4.1



රූපය 4.2 සටනට යොදා ගත් ජර්මන් යුද්ධ ටැංකියක්

## යුද්ධයේ ප්‍රධාන පාර්ශවකරුවන්

පළමුවන ලෝක සංග්‍රාමය ඇති වූයේ ක්‍රි.ව.1914 වන විට යුරෝපයේ ප්‍රධාන බලවතුන් විසින් ඇති කරගෙන තිබූ මිත්‍ර පිල හා මධ්‍යම බලවතුන්ගේ පිල යන දෙපාර්ශවය අතර යි.

| | | |
|---|---|---|
| මිත්‍ර පිලේ රටවල් | - | මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, රුසියාව සහ ඇමරිකා එක්සත් ජනපදය. |
| මධ්‍යම බලවතුන්ගේ පිල | - | ජර්මනිය, ඔස්ට්‍රියාව, ඉතාලිය, තුර්කිය, බල්ගේරියාව සහ හංගේරියාව. |

## යුද්ධයේ ආරම්භය සහ ව්‍යාප්තිය

පළමුවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රථම ගැටුම සිදු වූයේ සර්බියාව හා ඔස්ට්‍රියාව අතර යි. ඉන් පසු එම දෙරටේ මිත්‍ර පක්ෂ ක්‍රමයෙන් යුද්ධයට අවතීර්ණ වූහ. ඒ අනුව ඔස්ට්‍රියාවට ආධාර පිණිස ජර්මනියත්, සර්බියාවට ආධාර පිණිස රුසියාව හා ප්‍රංශයත් ප්‍රධාන පාර්ශවකරුවෝ ලෙස යුද්ධයට එකතු වූහ.


ආරම්භයේ දී බ්‍රිතාන්‍යය යුද්ධයට සම්බන්ධ නොවී ය. එහෙත් ජර්මන් හමුදා බෙල්ජියමට කඩා වැදීම නිසා තවදුරටත් සංග්‍රාමයෙන් ඉවත් ව සිටීම බ්‍රිතාන්‍යයට කළ නොහැකි විය. ක්‍රි.ව. 1912 දී ප්‍රංශය හා බ්‍රිතාන්‍යය අතර ඇති කොට ගෙන තිබූ ගිවිසුම අනුව, උතුරු මුහුදු ආරක්ෂා කිරීමේ වගකීම පැවරී තිබුණේ බ්‍රිතාන්‍යයට යි. ඒ අනුව ක්‍රි.ව. 1914 අගෝස්තු 04 වන දින මහා බ්‍රිතාන්‍යය ජර්මනියට එරෙහි ව යුද ප්‍රකාශ කරමින් යුද්ධයේ පාර්ශවකරුවකු බවට පත් විය. අගෝස්තු 12 වන දින මහා බ්‍රිතාන්‍යය, ඔස්ට්‍රියාව, හන්ගේරියානු අධිරාජයට විරුද්ධ ව ද යුද ප්‍රකාශ කරන ලදී. මෙසේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය යුද්ධයට සම්බන්ධ වීම නිසා, යුරෝපා යුද්ධයේ උණුසුම ලොව විසූ ජාතීන්ගෙන් වැඩි කොටසක් අතර සෘජු ව මෙන් ම වක්‍රව ද පැතිර ගියේ ය.

බෙල්ජියම එල්ල කළ බාධා මැඩ පැවැත්වූ ජර්මනිය පහසුවෙන් ම බෙල්ජියම හරහා ප්‍රංශයට ඇතුළු විය. ඔස්ට්‍රියාව ජර්මන් ආධාර ඇති ව රුසියාවට හා සර්බියාවට පහර දී, එම රටවල හමුදා පසුබෑමට ලක් කෙළේ ය. සර්බියාවට ආධාර පිණිස මිත්‍ර පාක්ෂික හමුදාවන්ට එරටට ඇතුළු විය නොහැකි වූයේ, ජර්මනියේ පක්ෂය ගෙන සිටි ග්‍රීසිය විසින් එම මාර්ගය අවහිර කිරීම නිසා ය.

මුල දී මධ්‍යම බලවතුන්ගේ පිලේ සාමාජිකයකු වූ ඉතාලිය යුද්ධය ඇරඹීමත් සමග මධ්‍යස්ථ ව සිටියේ ය. පසු ව රහස් ගිවිසුමක් මඟින් එරට මිත්‍රපාක්ෂික පිලට එකතු විය. ඉතාලිය පසු ව එසේ පිල් මාරු කොට යුද්ධයේ කොටස්කරුවකු වූයේ, ප්‍රදේශ කිහිපයක් තම රට සතු කොට ගැනීමේ අරමුණු ඇතිව යි. ඒ අනුව ක්‍රි.ව. 1915 මැයි මාසයේ ඉතාලිය ඔස්ට්‍රියා හන්ගේරියානු අධිරාජ්‍යයට එරෙහි ව යුද ප්‍රකාශ කරන ලදී.

අති නවීන යුද්ධායුධ ප්‍රයෝජනයට ගනිමින් දීර්ඝ සටන්වල යෙදුණු ජර්මන් හමුදාවලටත් මිත්‍රපාක්ෂික හමුදාවලටත් අපේක්ෂිත ජයග්‍රහණ ලැබිය නොහැකි වුව ද දෙපාර්ශවය ම කළේ අලුත් මිත්‍රයන් දිනා ගැනීමේ උත්සාහයක නිරතවීම යි. ඒ අනුව ජර්මනිය තුර්කි අධිරාජ්‍යයත්, බල්ගේරියාවත් සිය පක්ෂයට දිනාගත් අතර, බ්‍රිතාන්‍යය ප්‍රමුඛ මිත්‍ර පාක්ෂිකයෝ ඉතාලියට අමතර ව පෘතුගාලයත් ජපානයත් තම කඳවුරට එකතු කර ගත් හ. ජපන් නාවික හමුදා විසින් ජර්මනියට අයත් ව තිබූ චීනයේ කියෝතෝ ප්‍රාන්තය ද ෂැංටුං අර්ධද්වීපය ද අත් පත් කොට ගන්නා ලදී.

දෙපාර්ශ්වය අතර ගොඩබිම් සටන් මෙන් ම මුහුදු සටන් ද ඇති විය. යුද උපකරණ පමණක් නොව, ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේ දී පවා ජර්මනිය විසින් බ්‍රිතාන්‍යයට අවහිර කරන ලදී. බ්‍රිතාන්‍යයට අවශ්‍ය ද්‍රව්‍ය ගෙන එන මිත්‍රපාක්ෂික නැව්වලට අනතුරු නොහඟවා, පහර දෙන බව නිවේදනය කළ ජර්මනිය ඒ සමග නැව්වලට පහර දීම වේගවත් කෙළේ ය. ඒ හේතු කොට ගෙන බ්‍රිතාන්‍ය වරායන්ගෙන් පිටත් වන සෑම නැව් හතරෙන් එකක්වත් ජර්මන් සබ්මැරීන් ප්‍රහාරයට ගොදුරු විය.



රූපය 4.3 ජර්මන් ප්‍රහාරක යුද්ධ නැව

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

පළමුවන ලෝක යුද්ධයට පෙර යුරෝපයේ රටවල් දෙපිළකට බෙදුණු ආකාරය වගු ගත කරන්න.

## යුද්ධයේ ප්‍රධාන පාර්ශ්වකරුවකු ලෙස ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීම

ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම සිදු වූයේ ක්‍රි.ව. 1915 මැයි 07 වන දින ඇමරිකානු මගී පිරිසක් ද රැගත් ලුසිටානියා නැව ජර්මන් සබ්මැරිනයක් යොදවා ගිල්වා දැමීම නිසා ය. මීට පෙර මධ්‍යස්ථ ජාතියක් ලෙස කටයුතු කළ ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට අවතීර්ණ වීමට පෙර බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා ජර්මනිය වැනි යුද වැදී සිටි දෙපාර්ශ්වයේ ම රටවලට, ආහාරපාන, යුද්ධායුධ හා රෙදිපිළි යනාදිය අලෙවි කරමින් විශාල ලාභයක් ලැබී ය. එහෙත් ජර්මනිය විසින් ලුසිටානියා නැව ගිල්වා දැමීමෙන් පසුව, ක්‍රි.ව. 1917 අප්‍රේල් 06 වන දින ඇමරිකා එක්සත් ජනපදය ජර්මනියට එරෙහි ව යුද ප්‍රකාශ කෙළේ ය.

ඇමරිකා එක්සත් ජනපදය යුද්ධයට සම්බන්ධ වීම කීප ආකාරයකට ම යුද්ධයේ ගමන් මඟ වෙනස් කරවීමට හේතු විය. මේ අතර මධ්‍යම බලවතුන්ට එරෙහි ව ලෝක මතය එක්තැන් කළ ප්‍රචාරක ව්‍යාපාරයක් ද ඇමරිකා එක්සත් ජනපදය විසින් දියත් කරන ලදී. හිතුවක්කාර පාලකයන් නොව ජනතා කැමැත්ත මත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනු ලබන තැනක් බවට ලෝකය පත් කළ යුතු ව ඇති බව එමඟින් ප්‍රකාශ කෙරිණි. මෙම ප්‍රකාශය එතෙක් යුද්ධයෙන් හෙම්බත් වී සිටි ජාතීන්ගේ මානසිකත්වය සාමය සඳහා යොමු කිරීමක් විය.



රූපය 4.4 ලුසිටානියා නැව

## යුද්ධයේ ප්‍රතිඵල

- යුද්ධයේ වැදගත් ම ප්‍රතිඵලය වූයේ, මධ්‍යම බලවතුන් පරාජය වී මිත්‍ර පිල ජය ගැනීම යි. ඊට අමතර ව බෙහෙවින් විනාශකාරී ප්‍රතිඵල රැසක් මුළු ලෝකයට ම දායාද කෙරිණි.

- විශාල වශයෙන් මනුෂ්‍ය ඝාතන හා දේපළ විනාශ විය.

  මෙම සංග්‍රාමයේ දී මුහුණට මුහුණ ලා කරන සටන් වෙනුවට විද්‍යාත්මක හා තාක්ෂණික යුද්ධෝපාය මාර්ග භාවිත කෙරිණි. එමඟින් ගම් නියම් ගම් කෙත් වතු කර්මාන්තශාලා සහ සන්නිවේදන ක්‍රමවලට ද විශාල වශයෙන් හානි සිදු විය.

- මෙම යුද්ධයේ දී ඇමරිකාව විසින් විශාල ධනයක් උපයා ගන්නා ලදී. ලෝකයේ මහා බලවතා වීමට එරටට අවශ්‍ය ධනය, බලය සහ ශක්තිය ගොඩ නැඟීම ආරම්භ වූයේ පළමුවන ලෝක යුද්ධයේ සිට ය.


- වරදකරුවා වශයෙන් සලකා ජර්මනියට වර්සේල්ස් ගිවිසුමෙන් දැඩි දඬුවම් පැමිණ වී ය. වර්සේල්ස් ගිවිසුම ක්‍රි.ව. 1919 ජුනි 28 වන දින අත්සන් තබන ලදී. එය ජර්මනිය වෙත බලෙන් පැටවූ ගිවිසුමක් වුවත් එයට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට තරම් ශක්තියක් ජර්මනියට නො වී ය.

- යුරෝපයේ පැවති ඒකාධිපති රාජාණ්ඩු බිඳ වැටීම හා නව රාජ්‍ය ගණනාවක් බිහි වීම සිදු විය. ජර්මන් අධිරාජ්‍යය සහ ඔස්ට්‍රියා - හන්ගේරියානු මෙන් ම තුර්කි අධිරාජ්‍යය ද බිඳ වැටිණි. ඒවායේ පැවැති ඒකාධිපති පාලනය අහෝසි විය. ඒ වෙනුවට ජාතිකත්ව මූලධර්මය පදනම් කොට ගත් පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, ෆින්ලන්තය, රුමේනියාව, යුගෝස්ලෝවියාව වැනි අලුත් රාජ්‍යය කිහිපයක් බිහි විය.

- පළමුවන ලෝක මහා යුද්ධය සිදු වෙමින් පවතිද්දී රුසියාව පරාජයට පත් වීම හේතු කොට දූෂිත ඒකාධිපති පාලනයක් ගෙන ගිය සාර්වරයාට විරුද්ධ ව ක්‍රි.ව.1917 බෝල්ෂේවික් විප්ලවය සිදු කෙරිණි. එය ජය ගැනීමෙන් පසු සෝවියට් රුසියාව නම් වූ සමාජවාදී රාජ්‍යය බිහි විය.

- පැරණි නගර කිහිපයක නම් වෙනස් කෙරිණි. මෙසපොතේමියාව - ඉරාකය ලෙස ද කොන්ස්තන්තිනෝපලය - ඉස්තාන්බුල් ලෙස ද හැඳින්වීම නිදසුන් ලෙස දැක්විය හැකි ය.

- ලෝක සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවා ගැනිණි.




සිතියම 4.2 පළමු වන ලෝක යුද්ධයෙන් පසු යුරෝපය

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධ රටවල් සිතියමක ලකුණු කරන්න.
- යුද්ධයක් නිසා සිදු වන්නේ විනාශයකි. පළමුවන ලෝක යුද්ධය ඇසුරින් මේ ප්‍රකාශය විමසන්න.

## ජාතීන්ගේ සංගමය හා ලෝක සාමය

පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධානයක් පිහිටුවීමේ අවශ්‍යතාව පෙනී ගියේ ය. ඊට මූලික වී කටයුතු කෙළේ එවකට ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති වුඩ්රෝ විල්සන් ය.

## ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු

- ජාතීන් අතර ඇති වන ආරවුල් සාකච්ඡා මඟින් විසඳා ගැනීම
- ආර්ථික සම්බාධක පැනවීම මඟින් ආක්‍රමණ වැළැක්වීමට කටයුතු කිරීම
- මානව වර්ගයාගේ සාමකාමී පැවැත්ම සඳහා අවශ්‍ය වෙනත් පියවර ගැනීම
- ජාත්‍යන්තර සහයෝගය සහ අවබෝධය ගොඩ නැංවීම
- කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ආරක්ෂා කොට දීම

## ජාතීන්ගේ සංගමය සාමය සඳහා දරන ලද ප්‍රයත්න

- සංගමය පිහිටු වීමෙන් පසු ඉදිරියට වසර 20ක් පමණ කාලයක් යුද්ධ ඇති වීම වළක්වා ගැනීමට මෙම සංවිධානය සමත් විය.

- සයිලීෂියාව සම්බන්ධයෙන් ක්‍රි.ව. 1921 දී ජර්මනිය හා පෝලන්තය අතර ඇති වූ අර්බුදය, ග්‍රීසිය හා බල්ගේරියාව අතර ක්‍රි.ව. 1925 දී ඇති වූ අර්බුදය, මොසුල් තෙල් බිම් සම්බන්ධයෙන් ඉරානය හා තුර්කිය අතර ක්‍රි.ව. 1926 දී ඇති වූ අර්බුදය, යනාදි ය යුද්ධයකින් තොර ව විසඳීමට ජාතීන්ගේ සංගමයට හැකි විය.

- ග්‍රීසිය හා ඉතාලිය අතර ඇති වූ මතභේද විසඳීමට මැදිහත්කරුවකු ලෙස කටයුතු කිරීම සහ යුගෝස්ලෝවියාව සහ ඇල්බේනියාව අතර යුද්ධයක් ඇති වීම වැළැක්වීම ද, මේ කාලය තුළ ජාතින්ගේ සංගමය ලබා ගත් සාර්ථක ප්‍රතිඵල ලෙස දැක්විය හැකි ය.

- ජාතීන්ගේ සංගමයේ භාරකාරත්වයට පත් කොට තිබූ යටත් විජිතවල පරිපාලන කටයුතු,සාර්ථක ලෙස අධීක්ෂණය කිරීමට ද,මෙම සංවිධානයට හැකි විය.

- ඔස්ට්‍රියාව, හංගේරියාව සහ ග්‍රීසිය යන රටවලට ආර්ථික ආධාර ලබා දුන් අතර, සරණාගතයන් පුනරුත්ථාපනය කරනු ලැබී ය. යුද්ධයෙන් පසු ව පැතිරී ගිය බොහෝ ලෙඩරෝග මර්දනය කිරීමට ද නීති විරෝධී වහල් වෙළෙඳාම සහ මත්ද්‍රව්‍ය වෙළෙඳාම මර්දනය කිරීමට ද ජාතීන්ගේ සංගමය සමත් විය.

## ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු

- ජාතීන්ගේ සංගමය නිර්මාණය කිරීමට මූලිකත්වය ගත් ඇමරිකා එක්සත් ජනපදය ලෝක යුද්ධයෙන් පසු මහා බලවතකුගේ තත්ත්වයට පත් වී සිටිය ද ජාතීන්ගේ සංගමයේ සාමාජිකයෙකු නො වී ය. මෙම තත්ත්වය සංවිධානයේ අසාර්ථකත්වයට බලපෑ ප්‍රධාන හේතුවක් විය. ඇමරිකානු සෙනෙට් සභාව ජාතීන්ගේ සංගමයේ ඇතැම් කොන්දේසිවලට එකඟ නොවීම නිසා ඇමරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයට ඇතුළු කොට ගැනීමට ජනාධිපති වුඩ්රෝ විල්සන් අසමත් විය.
- ජාතීන්ගේ සංගමයේ සාමාජික ලැයිස්තුවට රටවල් 55ක් ඇතුළත් වී තිබූ නමුත් පළමුවන ලෝක යුද්ධයේ වැරදිකරුවා ලෙස සැලකුණු ජර්මනියට ද සෙසු රටවලට වඩා වෙනස් විප්ලවකාරී මත දැරූ රුසියාවට ද සාමාජිකත්වය අහිමි කොට තිබිණි. මේ නිසා ලෝක ජන සංඛ්‍යාවෙන් විශාල කොටසක් ද ලෝක භූමි ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් ද පාලනය කළ රාජ්‍ය කිහිපයකට සාමාජිකත්වය ලබා නොදීම ජාතීන්ගේ සංවිධානය ආරම්භයේ දී ම මුහුණ දුන් බරපතල අර්බුදයක් විය.
- සාමාජික රටවල් ආක්‍රමණික කටයුතුවල නිරත වීම වැළැක්වීම සඳහා අවශ්‍ය අවස්ථාවල දී යොදා ගත හැකි හමුදා ශක්තියක්,ජාතීන්ගේ සංගමයේ නොතිබීම ද එහි අසාර්ථකත්වයට හේතු විය.
- ඉතාලිය විසින් ඇබිසීනියාව ආක්‍රමණය කරනු ලැබූ අවස්ථාවේ,සංගමය විසින් සම්බාධක පැනවූ නමුත්, ඉතාලියට විරුද්ධ ව ඇබිසීනියාවට ආධාර කිරීමට සංගමය අපොහොසත් වීම ද,
- ක්‍රි.ව. 1931 දී ජපානය මැංචූරියාව ආක්‍රමණය කරනු ලැබූ අවස්ථාවේ, සංගමයේ අණ නොතකා ක්‍රියා කළ ජපානයට එරෙහි වූ කිසියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට සංගමය අපොහොසත් වීම ද නිදසුන් ලෙස දැක්විය හැකි ය.
- සංගමයේ ව්‍යවස්ථාවට අනුව තීරණ ගැනීමේ දී විධායක මණ්ඩලයේ සියලු දෙනා ඒකමතික විය යුතු විය. එහෙත් එබඳු ඒකමතික තත්ත්වයකට එළඹීම අතිශයෙන් දුෂ්කර වීම ද මෙම සංවිධානයේ අසාර්ථකත්වයට හේතුවක් විය.
- සාමූහික ව ලෝක සාමය ආරක්ෂා කිරීම අපේක්ෂා කළ නමුත් කිසිදු රටක් තම කාලය සහ ධනය ඒ සඳහා වැය කිරීමට සූදානම් නො වී ය.
- රටක අභ්‍යන්තර ආරක්ෂාව සඳහා පමණක් ප්‍රමාණවත් තරමට, අවි ආයුධ රැස්කිරීමට සෑම සාමාජික රටක් ම ප්‍රතිඥා දී තිබිණි. එම ප්‍රතිඥාව ඉටු කරවා ගැනීම සඳහා පිහිටුවීමට නියමිත වූ, නිරායුධ කොමිසම කිසි දිනක පත් කළේ නැත.
- එපරිද්දෙන් ජාතීන්ගේ සංගමය ආරම්භයේ සිට ම අසාර්ථක වීමේ ලක්ෂණවලින් යුක්ත විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

"ජාතීන්ගේ සංගමය ලෝක සාමය ආරක්ෂා කිරීමට ගත් උත්සාහය අසාර්ථක විය." මේ කියමනට පක්ෂ ව හා විපක්ෂ ව කරුණු දැක්වෙන සටහනක් පිළියෙල කරන්න.

## පැසිස්ට්වාදයේ හා නාසිවාදයේ නැඟීම

පැසිස්ට්වාදය හා නාසිවාදය ආඥාදායක පාලන ක්‍රමය මූලික සංකල්පය කොට ගත් මතවාද දෙකකි.

ලෝක මහා සංග්‍රාම දෙක අතර කාලයේ පැසිස්ට්වාදය ඉතාලියේ බෙනිටෝ මුසෝලීනී යටතේ ද නාසිවාදය ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර් යටතේ ද පැතිර ගියේ ය. මේ මතවාද දෙකට ම පදනම් වූ දේශපාලන සංකල්ප ප්‍රජාපීඩක පාලන ක්‍රමයක් ලෙස පොදුවේ පිළිගැනේ. ඒවායේ මූලික ලක්ෂණ වන්නේ ආයුධ සන්නද්ධ ප්‍රචණ්ඩත්වය යි.

පැසිස්ට්වාදය මෙන් ම නාසිවාදය ප්‍රජාතන්ත්‍රවාදය, ලිබරල්වාදය, කොමියුනිස්ට්වාදය යන දේශපාලන සංකල්පවලට විරුද්ධ ව පැන නැඟුණු මතවාද දෙකකි. ඔවුහු සිය දර්ශනවාද ගොඩ නැංවීමේ දී එකිනෙකට ප්‍රතිවිරුද්ධ වූ විවිධ සමාජ කණ්ඩායම් සියල්ල ම පාහේ සිය ව්‍යාපාරයට ඇතුළත් කොට ගැනීමට හැකි වන අන්දමින් මෙම මතවාද සකස් කිරීමට වගබලා ගත්හ. එබඳු සමාජ කණ්ඩායම් වූයේ ගොවීන්, විශාල ඉඩම් හිමියන්, කුඩා වෙළෙඳුන්, විශාල කර්මාන්තකරුවන්, වැටුප් ලබන සේවකයන්, දෛනික වේතන ලබන කුලීකරුවන් ආදී එකිනෙකට වෙනස් ජන කොටස් ය.

පළමුවන ලෝක සංග්‍රාමයට ක්‍රියාශීලී ව සම්බන්ධ වූ රටවල්, ආර්ථික වශයෙන් මහත් වූ පීඩනයට පත් වී තිබිණි. ජනතාව කිව නොහැකි තරම් දුෂ්කරතාවලට මුහුණ දී සිටියහ. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදී ව තෝරා ගත් ආණ්ඩු කෙරෙහි තැබූ විශ්වාසය, පලුදු වී තිබූ අතර ක්‍රියාත්මක වන ආකාරය කුමක් වුව ද උද්ගත වී තිබූ ප්‍රශ්න විසඳා ගත හැකි අන්දමේ ආණ්ඩුක්‍රමයක් ගොඩ නඟා ගැනීමට මහජනතාව උනන්දු වූහ.

ඒ අනුව පළමුවන ලෝක යුද්ධයෙන් පසු කාලයේ දී, ඉතාලියේ පැසිස්ට්වාදී මතවාදය හා ජර්මනියේ නාසිවාදය වඩාත් ප්‍රබල ලෙස ප්‍රචලිත වීමේ පසුබිමක් දක්නට ලැබිණි. පැහැදිලි ප්‍රතිපත්ති මත පදනම් වූ දැඩි විනයකින් යුක්ත දේශපාලන පක්ෂ ලෙස සංවිධානය වී ක්‍රමයෙන් ඒවා පක්ෂයේත්, නායකයාගේත් දැඩි ආධිපත්‍යයට යටත් කොට, අත්තනෝමතික ආඥාදායකත්වය දක්වා වර්ධනය කරනු ලැබී ය.